# මහින්ද පෙරටම

***කිලිනොච්චිය අල්ලා ගැනීම සහ ඇමති මණ්ඩල සංශෝධනය මහින්දගේ බලය තහවුරු කරයි***



පිලිබඳ අමාත්‍යාංශය ආචාර්ය සරත් අමුණුගම ට පැවරීමට මහින්ද තීරණය කලේ ය.

සියල්ල සිදුවෙමින් තිබෙන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ශක්තිය තව තවත් තහවුරු කරමින් ය. කරු ජයසූරිය රජයෙන් ඉවත්ව එක්සත් ජාතික පක්ෂයට එක්වීම පවා මහින්දගේ වාසියට හේතු වී තිබීම විස්මිත ය.

කරු එජාපයට යාමට මතු පිටිනේ පෙනෙන හේතුව ආණ්ඩුව තුළ නිසි අගැයීමකට ලක් නොවීම බව වුව ද එයට වඩා වෙනත් හේතු කාරණා තිබිය හැකි බව තතු දත් අය පවසති. කෙසේ වුව ද කරු ගේ එජාප ගමනින් පසුව හිස් වූ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු

අනුර ප්‍රියදර්ශණ යාපා මහතා රජයේ ජනප්‍රිය ඇමති වරයෙක් නොවේ. ජනමාධ්‍ය ඇමතිව සිටිමින් ඔහු විසින් කරගෙන යනු ලබන යම් යම් වැඩ පිලිවෙල බොහෝ අයගේ විවේචනයට කල් විය.ගුවන් විදුලි සංසථාව සතු යම් යම් දේපළ විකුණා දමන්නට ඔහු ගත් පියවරට විරුද්ද වීම නිසා සංස්ථාවේ හිටපු සභාපතිවරයා වූ සුනිල් සරත් පෙරේරා මහතාට ද තනතුර හැර දමා යන්නට සිදුවිය. සිය සමීප හිතවතකු වන සුනිල් සරත් පෙරේරා මහතා හරහා ජනාධිපතිවරයා ජනමාධ්‍ය ඇමතිවරයාගේ කෙරුවාව දැනගන්නට ඇති බවට සැකයක් නැත. එබැවින් ඉතා ඉක්මණින් ජනමාධ්‍ය ඇමති ධුරයේ වෙනසක් සිදුවනු ඇති බව තැනින් තැන කියැවෙනු ඇසුණි. එසේ වුව ද පසුගියදා සිදුවූ ඇමති තනතුරු ප්‍රදානයේදී කලින් අමුණුගම මහතා දැරූ ආයෝජන ප්‍රවර්ධන හා ව්‍යවසාය සංවර්ධන ඇමති ධුරය ද අනුර ප්‍රියදර්ශණ යාපා මහතාටම පිරිනැමුනේ බොහෝ මැති ඇමති වරුන් විශ්මයට පත් කරවමිනි.

ඇමති මණ්ඩලයේ තවත් වෙනස්කම් කීපයක් නුදුරු අනාගතයේදීම සිදුවන බවට රාවයක් දැන් දැන් පැතිර යයි. මේ සංශෝධනයේදී විමල් වීරවංශ මහතාගේ ජාතික නිදහස් පෙරමුණට ද ඇමති තනතුරු කීපයක් පිරිනැමෙන බවක් ද කියැවෙයි. රජයෙන් බාහිරව සිටියද රජයේ නායකයනට වඩා මෙහෙයක් රජය වෙනුවෙන් කරමින් සිටිය විමල් වීරවංශ මහතාට කළගුණ සැළකීම එසේ සිදුවනු ඇතැයි තැන තැන කතා බහ කෙරෙයි.

මධ්‍යම හා වයඹ පළාත් සභා විසුරුවා හැර මැතිවරණයකට යන්නට මහින්ද රාජපක්ෂ මහතා තීරණය කිරීමත් කිලිනොච්චි ජයග්‍රහණයක් එකට සිදුවීම අහම්බයක් නොවන බව පැහැදිලි ය. කිලිනොච්චි ජයග්‍රහණය හරහා මහින්ද රාජපක්ෂ රජය ලබාගත් අති විශාල ජවය විසින් මේ මැතිවරණ දෙකම රජයේ සාක්කුවටම දමා දෙනු ලබන බව නිසැක යයි දේශපාලන විචාරකයෝ විශ්වාසය පළ කරති.

කුසල් වීරසිංහ

---

# රසිකගේ "සිව් සිත් කවි"

ඔස්ට්‍රේලියාවේ සිංහල සාහිත්‍ය කෙතට එක්වූ අළුත්ම නිර්මාණය නම් සිඩ්නි නුවර වාසය කරන රසික සූරියආරච්චි ලියූ "සිව් සිත් කවි" කාව්‍ය සංග්‍රහයයි.




"සිව් සිත් කවි" යනු සිත් හතරක උපන් සිතිවිලිය. රසික සූර්යආරච්චි විසින්ම පසු ගිය වසර කිහිපය තුළදී විවිධ නම් හතරකින් ලියූ කවි මේ සංග්‍රහයට ඇතුලත් කර තිබේ. ඒ අනුව විවිධ නම් හතරක් යටතේ කොටස් හතරකින් මේ කාව්‍ය සංග්‍රහය සමන්විත වුවද "සිව් සිත් කවි" එකම සංග්‍රහයක් සේ කියවා රස විඳිය හැකිය.

කවියත් ගීතයත් අතර ඇත්තේ එක් පවුලක දෙසොහොයුරන්ටත් වඩා සමාන නමකි. රසිකගේ ඇතැම් කවි කියවන විට ඒ කවිපද අනුව ගීතයක තාලයක් සිතට නැගෙයි. 'සමුගැනීම', 'මතකයි තවමත්', 'පියඹ', 'ප්‍රතිඥා', 'සති පූජා' ආදී කවි මෙයට නිදසුන් කිහිපයක් පමණි.

රසිකගේ "සිව් සිත් කවි" කියවීමේදී මගේ අවධානයට යොමුවන කරුනු කිහිපයකි. පළමුවැන්න නම් පැරණි සිංහල සන්දේශාවලියෙන් රසික ලබා ඇති නිර්මාණාත්මක අභාෂයයි.

"අහස උසට විහිදෙන සුවිසල් මැදුරූ
පහස ලබති සීතලමේ කුළු සොඳුරූ
දහස සියක් නෙක පැහැ මල්පිපි පඳුරූ
කෙලෙස කවෙන් ඒ රුව වනම් ද මිතුරූ

මේ කව උපුටා ගන්නා ලද්දෝ "කුකුබරා සන්දේශය සිඩ්නි පුර වැනුම" නැමැති කවියෙනි.

රසික සූර්යආරච්චි ඉතා ශූර ලෙස ගැමි බස් වහර චිලිසමය සමග එක්කොට නිර්මාණය කළ කාව්‍ය නිර්මාණ කිහිපයක් මේ සංග්‍රහයට ඇතුලත් වී තිබේ. ළමයින් ලද අම්මාට කෙරෙන කාරුණික ආයාචනයයි." යන නිර්මාණයේ එන පහත දැක්වෙන පදය මෙයට හොඳ නිදසුනකි.

"පුන් පෝදා පෑයු හඳ වගේ නුඹේ පෙම් සිනාව
සුන් කදරා දුක් ගින්දර ඒ දිනවල පින් ගෙනාව
දැන් පෙරදා වගේ නැතිය හැමදාමත් අඳෝනාව
පින් මදිදා එකතුවෙන්න හිත දහඅත කල්පනාව"

කවියක් යනු භාෂාවක් අභ්‍යන්තරයේ පවතින භාෂාවකි. බාහිර භාෂාවන් පළ කළ නොහැකි අදහස් අභ්‍යන්තර භාෂාවෙන් පළ කරන විටය කවියක් උපදින්නේ. රසික මේ මුලධර්මය හොඳින් අවබෝධ කරගෙන කවි මගට පිවිසි බව පෙනෙනෙ කවි කිහිපයක්ම "සිව් සිත් කවි" සංග්‍රහයට ඇතුලත් වී තිබේ. 'යළිත් තනිකම' නැමැති කවියේ එන යෙදුමක් මෙසේය.

'උපැස් යුවලක් තුළින් බැළු මුත්
අදත් ලෝකය යටිකුරුව ඇත.' (පි.ස.)

ප්‍රතිභාපූර්ණ කවියකුගේ නිර්මාණ කුසලතාව හොඳින් පෙන්වන ලකුණක් නම් කාව්‍ය නිර්මාණ මගින් අලුත් අත්හදා බැලීම්වල නිරතවීමට දරන ප්‍රයත්නයයි. රසිකගේ කවි තුළින් 'මා දුටු තවත් විශේෂ ලක්ෂණයකි එය. 'අවුරුද්දේ අඩුවක්' නැමැති කවිය සිව් පද ස්වරූපයෙන් ලියවුනද පද තුනකට පමණක් සීමා කර තිබේ.

'එක පදයක් අඩු කවියක් වාගේ තව නව වසරක්
උදාවුණා'

මේ කාව්‍ය නිර්මාණයේදී කවියේ අන්තර්ගතය අනුව ආකෘතිය හැඩගැස්වීමට රසික සාර්ථක ප්‍රයත්නයක යෙදී ඇත. "අවුරුද්දේ අඩුවක්" නිර්මාණය මෙයට හොඳ නිදසුනකි.

පැරණි කාව්‍ය රීතිය හා ආකෘතිය උපයෝගී කරගෙන නව කාව්‍ය සංකල්පය ඉදිරිපත් කිරීමට රසික උත්සහ ගෙන ඇත. එය ඔහුගේ නිර්මාණ සංග්‍රහයේ මා දුටු තවත් කැපී පෙනෙන ලකුණකි. "ඊ පෙම ගැන බැඳුණ ඊ - විරහ ගීය" නැමැති නිර්මාණයේ අවසන් පදය මෙසේය.

"පරිඝණකයෙ විද්‍යුත් ලිපි ගොනුවට වෛරස් ආසාදනයක් දෝ
දුරකථනයේ පිරිවැය සීමා බිඳී අන්තර්ජාලය ගොළුවුණි දෝ
විශ්ව ගමේ නිතරම දුටු සැවුළිඳු කරමළ සුදු පැහැ ගැන්වුණි දෝ
අන්තර්ජාලෙ දී බැඳි ඊ - පෙම්දම අන්තර්ජාලම මියගියේ දෝ"

***කවියක් යනු භාෂාවක් අභ්‍යන්තරයේ පවතින භාෂාවකි. බාහිර භාෂාවෙන් පළ කළ නොහැකි අදහස් අභ්‍යන්තර භාෂාවෙන් පළ කරන විටය කවියක් උපදින්නේ. රසික මේ මුලධර්මය හොඳින් අවබෝධ කරගෙන කවි මගට පිවිසි බව පෙනෙනෙ කවි කිහිපයක්ම "සිව් සිත් කවි" සංග්‍රහයට ඇතුලත් වී තිබේ.***

## පැතිකඩ



කාව්‍ය යනු රසවත් වැකියක් ය යන පැරණි අලංකාරිකයන්ගෙ මතයෙන් අදහස වන්නේ අළුත් හැඟීම් දනවන අයුරින් භාෂාව උපයෝගී කරගැනීමට කවිය දනවන කුසලතාවයේ ප්‍රතිඵලය විය හැකිය. භාෂාව ශූර අන්දමින් හසුරුවමින් අලුත් යෙදුම් අත්සදා බැලීමට මෙහිදී වැදගත් වේ. රසික සූර්යආරච්චි යොදා ඇති පහත දැක්වෙන යෙදුම් දෙස බලන්න.

"බලාපොරොත්තුව ගබ්සා වී යයි" (බවුන් වැඩීම)

"සහෝදරත්වයේ
සළුපට ගිලිහිණ
අමානුෂිකත්වයෙ
නිරුවත හෙළිවිණ"
(එක්තරා සිදුවීමක් - 1983 මැයි 11)

මුලින්ම කාව්‍ය නිර්මාණයක් එළි දක්වන ලේඛකයා අධුනික කවියකු ලෙස සලකා විවේචනය කිරීම අපේ රටේ විචාරකයන්ගේ සිරිතයි. එහෙත් රසික සූර්යආරච්චි කවියා සම්බන්ධයෙන් එවන් නිගමනයකට එළඹීම සාධාරණ නොවේ. "සිව් සිත් කවි" කාව්‍ය සංග්‍රහයෙන් රසික පළ කරන්නේ අධුනික කවීත්වයක් නොව ප්‍රවීන කවියෙකුගේ පරිණතභාවයකි. රසිකගේ කාව්‍ය සංග්‍රහය පාඨක හා විචාර අවධානයට ලක් විය. යුත්තේ මේ පදනම මත පිහිටා ය.



ආචාර්ය පාලිත ගනේවත්ත



රසික සූර්යආරච්චි